# SLLA NEWSLETTER

Vol. 38 Issue 04April – June2022 | ISSN 1391 -2531| © All Rights Reserved by SLLA






ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවිධානය කරන ලද කථිකාචාර්යවරුන් ඇගයීම සහ ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීමේ උත්සවය 2022 ජුනි 24 වන දින කොළඹ 07, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවතේ, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති, ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයේ (NILIS) අධ්‍යක්ෂක ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී විය.

කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු පුස්තකාලයාධිපති සහ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ප්‍රවීණ කථිකාචාර්ය මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතා මෙහි විශේෂ ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

## NACLIS ’22 on 21st September

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික සමුළුව (NACLIS-2022) 2021 සැප්තැම්බර් 21 වැනි දින පැවැත්වීමට නියමිතය.

NACLIS 2022 "තිරසර අනාගතයක් සඳහා පුස්තකාල සවිබල ගැන්වීම" යන තේමාව යටතේ පූර්ණ අතථ්‍ය සම්මන්ත්‍රණයක් ලෙස පැවැත්වේ. තෝරාගත් පුස්තකාල සහ තොරතුරු විද්‍යා (LIS) පර්යේෂණ ප්‍රතිඵල සැසිවාරයේදී ඉදිරිපත් කෙරේ.

## රෝහිණී පරරාජසිංහම් මහත්මියට උපහාරය (SLLA හි යාවජීව සාමාජික සහ වරලත් පුස්තකාලයාධිපති, සාමාජික අංක 18)



ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) ආරම්භක සාමාජිකාවක් වන රෝහිණී පරරාජසිංහම් මහත්මිය (යාපනය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමලත් පුස්තකාලයාධිපතිනිය) ගේ අභාවය පිළිබඳව අපි බලවත් ශෝකයට පත් වෙමු. ඇය 2022.04.27 වන දින යාපනයේ පේදුරුතුඩුවේදී අභාවප්‍රාප්ත වූ අතර සිය ජීවිතයෙන් සමුගන්නා විට වයස අවුරුදු 82 කි. (ඇගේ කෙටි චරිතාපදානය කියවීමට 12 වන පිටුවට පිවිසෙන්න)

Inner Pages

SLLA CouncilPage 02 | GM Speech | CollectiveBook LaunchPage 05 |
Feature Article Page 06

## රෝහිණී පරරාජසිංහම් මහත්මියට උපහාරය

### රෝහිණී පරරාජසිංහම් මහත්මිය

BSc Hons (Zoology)(Madras), PG Dip. (Librarianship) (Peradeniya), MSc (LIS) (Madras), FLA (Sri Lanka)

### පුස්තකාලයාධිපති, යාපනය විශ්වවිද්‍යාලය

(1995 මාර්තුසිට 2005 සැප්තැම්බර්)



ඇය යාපනයේ පේදුරුතුඩුවේ උපත ලැබූ අතර ඉගෙනුම ලැබුවේ ජේ/මෙතෝදිස්ත බාලිකා උසස් පාසලෙනි. ඉන්පසුව, 1961 දී ඉන්දියාවේ මදුරාසි විශ්ව විද්‍යාලයෙන් සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් සමඟින් ඇයගේ කීර්තිමත් වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. පසුව ඇය 1964 සිට 1965 දක්වා කාලය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හදාරා ඇත. 1983 දී මදුරාසි විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළ අතර, එහිදී ඇය සිය ශිෂ්‍ය අවධියේදී ඇයගේ හැකියාවන් සහ කැපවීම වෙනුවෙන් ශාස්ත්‍රපති උපාධි විභාගයෙන් 'විශිෂ්ඨ' ශ්‍රේණියක් ලබා ගත්තාය.

1978 දී සහකාර පුස්තකාලයාධිපතිනියක ලෙස යාපනය විශ්වවිද්‍යාලයට බැඳුණු ඇය ඉතා කැපවීමෙන් සේවය කලාය. මාස 10ක වැඩබලන පුස්තකාලයාධිපති තනතුරේ සේවය කිරීමෙන් අනතුරුව 1995 මාර්තු මාසයේදී යාපනය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනිය ලෙස උසස් වූවාය. 1995-2005 කාල වකවානුවේදී යාපනය අර්ධද්වීපයේ පැවති සිවිල් ගැටුම් හේතුවෙන් අභියෝග රැසකට මුහුණදෙමින් ඇය පුස්තකාලයාධිපතිනිය ලෙස සේවය කළේය. ඇයගේ පෞද්ගලික ජීවිතයටද ඇතිවීමට තිබූ අවදානම් තත්ත්වයන් නොසලකා හැර පුස්තකාල එකතුව විවිධ හානිවලින් හා විනාශයන්ගෙන් බේරා ගැනීමට ඇයට හැකි විය. පුස්තකාලය සඳහා ඇයගේ කැපවීම මෙයින් සනාථ වන අතර පුස්තකාලය වෙනුවෙන් ඇයගේ කැපවීම කෙසේද යත් ඇයගේ සප්ත වාර්ෂික නිවාඩුව පවා ලබාගෙන නොමැත.

වඩාත්ම අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් තුළ වුවද, දක්ෂ ශාස්ත්‍රීය පරිපාලකවරියක ලෙස අතළොස්සක් වූ කාර්ය මණ්ඩලයක් සමඟ ඇය සිය පුස්තකාල කටයුතු සිදු කළාය. 1980 දී ආරම්භ කරන ලද පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2001 දී ඇයගේ පාලන සමයේදී නිම කරන ලද අතර එය එවකට විශාල ජයග්‍රහණයක් විය. මීට අමතරව, 2003 දී ආරම්භ කරන ලද පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය ඇය විශ්ව විද්‍යාලයට කළ දූරදර්ශී සේවයේ එක් සන්ධිස්ථානයකි. වෘත්තීය සංවර්ධනය සම්බන්ධයෙන්, යාපනය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2005 දී ආරම්භ කිරීමට ඇය මූලික වූවාය. කලාපයේ පුස්තකාල වෘත්තිකයන් අතර වෘත්තීය නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව නැවත ආරම්භ කිරීම 2002 වසරේ යාපනයේ දී සිදු කල අතර ඒ සඳහා ඇයගේ මැදිහත්වීම කැපී පෙනේ. ඇය වෘත්තියට කළ අගනා මෙහෙවර සැලකිල්ලට ගත් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඇයට 'අධි සාමාජිකත්වය' ප්‍රදානය කරමින් ගෞරව කළ අතර ඇයව 'වරලත් පුස්තකාලයාධිපතිනිය' ලෙස පිළිගැනිණි.

ඇය විසින් අනුක්‍රමණිකාකරණය, සූචිකරණය සහ පුස්තකාල කළමනාකරණය පිළිබඳ ග්‍රන්ථ කිහිපයක් සහ පුස්තකාල අධ්‍යාපනය පිළිබඳ විවරණ ග්‍රන්ථ නාමාවලියක් ද ප්‍රකාශයට පත් කර ඇත. තවද ඇය විසින් පුස්තකාල විද්‍යාව සම්බන්ධ සම්මන්ත්‍රණ සහ සමුළු කිහිපයක සම්පත් දායකයෙකු ලෙස සේවය සපයා ඇත. යාපනය විශ්වවිද්‍යාල පුස්තකාලයේ වසර 27ක දීර්ඝ කාලයක් තනතුරු කිහිපයක සේවය කිරීමෙන් අනතුරුව 2005 දී ඇය විශ්‍රාම ගියාය. විශ්‍රාම ගැනීමෙන් පසුවද, ඇය පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලා සඳහා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා (DIPLIS) පාඨමාලාව සඳහා දේශන පවත්වමින් 2015 වසර දක්වා පුස්තකාල වෘත්තියේ දියුණුවට දායක වූවාය.

කලාපයේ වඩාත්ම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ යාපනය විශ්වවිද්‍යාල පුස්තකාලය නඟා සිටුවීමට ඇයකළ විශිෂ්ට දායකත්වය සදාකාලිකව සිහිපත් වේ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) ඇයගේ වියෝව පිළිබඳ බලවත් ශෝකය ප්‍රකාශ කරන අතර වියෝ වූ පවුලේ සැමට සහ ඥාති හිතමිත්‍රාදීන්ට සංවේගය පළ කරන්නෙමු. ඇයට නිවන් සුව ලැබේවා.

(සටහන: ආචාර්ය කේ.චන්ද්‍රසේකර් මිය (වැඩබලන පුස්තකාලයාධිපති, යාපනය විශ්වවිද්‍යාලය)

# යාපනය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික හිටපු පුස්තකාලයාධිපති ආර්. පරරාජසිංහම් මහත්මියගේ අනුස්මරණය 31 වන දින



2022 අප්‍රේල් මස 27 වන දින අභාවප්‍රාප්ත වූ විශ්‍රාමික හිටපු පුස්තකාලයාධිපතිනී රෝහිණී පරරාජසිංහම් මහත්මිය පුස්තකාල වෘත්තියේ උන්නතිය වෙනුවෙන් කළ මෙහෙවර සිහිපත් කරමින් යාපනය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය විසින් 31 වැනි දින අනුස්මරණ උත්සවයක් සංවිධානය කරන ලදී.

මෙම උත්සවය 2022 මැයි 27 වන දින යාපනය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වූයේ විශ්වවිද්‍යාල, මහජන, පාසල් පුස්තකාලවලට අනුයුක්ත පුස්තකාල වෘත්තිකයන්, යාපනය විශ්වවිද්‍යාලයෙහි විශ්‍රාමික පුස්තකාල කාර්ය මණ්ඩලය සහ ඇයගේ පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙනි. ප.ව. 3.00 ට උත්සවය ආරම්භ වූයේ සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීමෙනි. අභාවප්‍රාප්ත ආර්.පරරාජසිංහම් මහත්මියගේ ඡායාරූපයට පුෂ්පාංජලී පිදීම සිදු කලේ මියගිය ආත්මයට අවසන් ගෞරව දැක්වීමේ සංකේතයක් වශයෙනි.



ඉන් අනතුරුව යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එස්. ශ්‍රීසත්කුනරාජා මහතා, සම්මානිත මහාචාර්ය පී. බාලසුන්දරම්පිල්ලේ මහතා, වැඩබලන පුස්තකාලයාධිපති ආචාර්ය කේ. චන්ද්‍රසේකර් මිය, විශ්‍රාමික සහකාර ලේඛකාධිකාරී/පුස්තකාල සේවා එම්. සින්නරාජා මහතා ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ යාපනය මහජන පුස්තකාලයේ නියෝජිතයන් විසින් උපහාර දේශන පවත්වන ලදී. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති එස්.කේතීස්වරන් මහතාගේ ස්තුතිය ප්‍රකාශයෙන් අනතුරුව ප.ව. 4.30 ට පමණ උත්සවය අවසන් විය.





# Digital Reading

## Introduction

During the civilization of human beings, our ancestors used signs, signals, and sound to communicate. Then language was revolutionized to communicate among persons. While language was emerging people tried to document information by using clay tablets, papyrus leaves, olaleaves, bamboo, mulberry bark, linen, hemp, plant fibers, etc., to usethe information for learning and scholarly activities. Since then they started to read. Paper was invented by a Chinese scholar Ts'ai Luan of China (105 AD) and in 1056 first paper mill was built in Spain. Johannes Guttenberg invented the printing machine in 1450 and established Guttenberg Press in 1455. Since then literary works, have tremendously grown and people quench their thirst for learning by utilizing reading paper-based printed materials. Reading is considered one of the essential activities of human life.

Reading develops a good spirit, attitude, vocabulary and language power, creativity, knowledge, and skills. But, nowadays teachers and parents worry about the decline of reading habits among youngsters and school children. Furthermore, librarians worry about the diminishing nature of reading printed materials housed in libraries. Especially, public librarians say that older people still use to visit the library and read, but rarely the youngsters. Therefore, serious attention should be paid to the decreasing nature of reading habits among the younger generations. Librarians are in a position to find alternative approaches to motivate reading. Since 2000, electronic materials have come to the stage and slowly replacing print materials. Hence there is a need for acquiring such electronic materials and guiding patrons toward effective online reading.



Source:: https://blog.sift.com/10-things-need-know-digital-natives/

Librarians, teachers, and parents should understand the nature of the present generation. Who are our children? What are their habits? What are their preferences? Are we coping with their needs and wants? Is it alright for the generation gap between our children and us to influence their reading habits? No, never.

Our children are born in digital environments. According to Prensky (2001), they are known as 'digital natives. They are fond of technical devices, digital technology, and online reading materials. But, their parents, teachers, and librarians may not digital natives, they might havebeen born a generation before the digital natives. We use to give them reading materials from printed textbooks, magazines, and stories. They are reluctant to see dense text-based printed materials and conventional-style tables and chairs. Therefore it is vital to explore their preferences and to migrate as digital immigrants. Then only librarians can be committed to the needs and want of the digital natives. Even if we introduce them to electronic devices they use them for various other purposes.




Source:
https://sites.google.com/site/elps710/readings---curriculum/digital-natives-digital-immigrants

Therefore, librarians must instruct the children that computers, tabs, smartphones, laptops, and Internet are not only made for entertainment but also learning. These devices are mainly made for learning, rather than playing games and watching films, communication, and other entertainment. Children should be properly guided to utilize these resources for learning purposes. Even they can use them for leisure reading. Parents and teachers should inculcate digital reading habits among the digital natives. Librarians can motivate their patrons todo the digital reading.The introduction of digital resources has brought about significant transformations in reading practice and behavior.

**What is digital reading?**

Digital reading is a kind of screen-based reading. Nordquist (2017) In Lim and Toh (2020) defines it as follows.

“Digital reading is ‘the process of extracting information from a text that is on a digital device’ – computers, tablets, mobile phones, and e-readers. The process may be mediated by reading applications (e.g. iBooks on the iPad).”

This definition simply says as extracting information from digital devices is digital reading whilst Buccellati (2008) In Lim and Toh (2020) says digital reading is not only reading digital text but also reading images, audio, video, and animation. He has indicated as “these multimodal digital texts can include e-books, social media communication, and articles on websites”.

This screen-based reading behavior is characterized by spending more time on browsing and scanning, keyword spotting, one-time reading, nonlinear reading, and reading more selectively. There is a common criticism of digital reading as this gives eye strains, short attention span, fragmented and less comprehension. Nevertheless, the advantages of digital reading overweighing paper-based reading, and the shallow ideas of such critics. Due to the powerful online culture that penetrates the digital natives, positive attention is essential towards digital reading by considering the advantages such as interactivity, nonlinearity, and immediacy of accessing information, storing, distributing, retrieving, annotating, highlighting, and navigating are possible.

## Conclusion and Recommendation

There are ample reading materials freely available via Open Access, but as Sri Lanka faces a financial crisis, subscription to electronic materials may not be possible. Librarians can guide their patrons towards Open Access Books, Open Access Journals, virtual libraries, institutional repositories, and

subject gateways to find materials for digital reading. Digital reading competency is essential for e-learning.A few links are given below to access electronic resources.

1. National Digital Library and repository of Sri Lanka, developed by the National Library & Documentation Services Board (NLDSB): http://diglib.natlib.lk/
2. Knowledge Repository of National Science Foundation : http://www.nsf.ac.lk/index.php/science-for-all
3. To read materials in the Tamil language: https://noolaham.org/
4. To read materials in the Sinhala language : https://kathuwaraya.com
5. Asia Foundation Children Library:https://asiafoundation.org/what-we-do/books-for-asia/lets-read/https://www.letsreadasia.org/
6. Directory of Open Access Journals: https://doaj.org/
7. Directory of Open Access Books: https://www.doabooks.org/

This feature article recommends empowering readers by giving intuitive and natural reading experiences in an online environment. Digital reading should be developed as an everyday practice as the Net generation, Millenials, and post-Millenials have been "**born digitally**".

## References

Chen, Wang and Lin (2019), A visual interactive reading system based on eye tracking technology to improve digital reading performance, *The Electronic Library*, Vol. 37(4), pp. 680-702

Lim & Toh, 2020. How to teach digital reading? *Journal of Information Literacy*, 14(2), http://dx.doi.org/10.11645/14.2.2701

Liu, Z. (2012), "Digital reading: an overview", *Chinese Journal of Library and Information Science*, Vol. 5 No. 1, pp. 85-94.

Mashroofa, M. M. (2013). Requirements of Net Generation towards university libraries in Sri Lanka. *Journal of the University Librarians Association of Sri Lanka*, 16(2), pp.101–116. http://doi.org/10.4038/jula.v16i2.5202

Prensky, M. (2001). Digital Natives, digital immigrants,*On the Horizon*, 9(5).

Somaratne, S. (2019), Millennials' Service Quality Expectations: A Challenge for Academic Librarians, *Journal of the University Librarians Association of Sri Lanka*, Vol.22(2), July 2019, 74-85DOI: http://doi.org/10.4038/jula.v22i2.7938



Dr. Mohamed Majeed Mashroofa
Senior Assistant Librarian
South Eastern University of Sri Lanka
mashroof@seu.ac.lk

# COMAISP යාවත්කාලීන කිරීම්

**ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) උපාය මාර්ගික සැලැස්ම 2016-2022 කාලසීමාව සඳහා උපාය මාර්ගික සැලසුම් හා උපාය මාර්ගික මාර්ගෝපදේශ කමිටුව (SPSDC) විසින් සකස් කරන ලදී. උපාය මාර්ගික ක්‍රියාමාර්ග බොහොමයක් ඉතිරිව ඇති බැවින්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වත්මන් කාර්යමණ්ඩලය එම කාලය වසර පහකින් දීර්ඝ කර ඇත. එස්. එස්. ශාන්ත රූබන් මහතා විසින් කැඳවන ලද උපායමාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීමේ අධීක්ෂණ සහ සහායක කමිටුව (COMAISP) නව ව්‍යාපෘති හඳුනා ගැනීමට සහ අපේක්ෂිත ව්‍යාපෘති පුනර්ජීවනය කිරීමට මූලික වේ. පසුගිය වසර දෙකක උපායමාර්ගික සැලැස්මෙන් පහත ව්‍යාපෘති නිම කර ඇත. මෙම ව්‍යාපෘති ලේඛනවලට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙබ් පිටුව හරහා ප්‍රවේශ විය හැක.(https://www.slla.lk/index.php/activities/comaisp-projects).

| Project | Convener |
|---|---|
| 1. The Minimum standard for the libraries in orphanages and child protection centers. | Mr. Sunil Premaratne |
| 2. SLLA Gateway of Online Resources | Mr.M.N.Ravikumar, |
| 3. Revision of the SLLA Rules. | Mrs. Shivanthie Weerasinghe |
| 4. Guidelines for Library building plans and interior designs for Academic Libraries in Sri Lanka | Dr. K R N Harshani |

පහත ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

| Project | Convener |
|---|---|
| 1. A Guide to resources and services of Institute Libraries in the University sector in Sri Lanka | Mrs. Sujeewa Rathnayake |
| 2. Develop a model Prison Library at Welikada Prison | Mrs.Padma Bandaranaiyake |
| 3. Standards for National Library of Sri Lanka | Mr. U. Amarasiri |
| 4. Formulation of guidelines and a framework for the national digital library for Sri Lanka | Mrs. Nadeeka Rathnabahu |
| 5. An introduction to library software useful for Sri Lankan libraries and information services | Mrs. Nadeeka Rathnabahu |
| 6. A Compendium of library legislation in Sri Lanka | Mrs. Yanika Nandasena |
| 7. Collection development policy for Provincial Central Libraries in Sri Lanka | Mr. Wijaya Premadarshana |
| 8. Digitization of SLLA office documents (Phase II) | Mrs.Priyani Balasooriya |



මහතා නැවත පත් කර ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය ආනන්ද තිස්ස පවසන පරිදි, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම 2023 සිට 2027 දක්වා දීර්ඝ කර ඇත. වර්තමානයේ, COMAISP ව්‍යාපෘති අටක ප්‍රගතිය නිරීක්ෂණය කරමින් සිටින අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයින්ගෙන් නව ව්‍යාපෘති ඉල්ලා ඇත.




**කථන ඉංග්‍රීසි @ කොළඹ මහජන පුස්තකාලය**

කොළඹ මහජන පුස්තකාලය විසින් 6 සිට 9 ශ්‍රේණි දක්වා පාසල් ළමුන් සඳහාත්, අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) සිසුන් සඳහාත් ඉංග්‍රීසි කථන පන්ති පැවැත්වූ අතර එය සතියකට පන්ති හතරක් බැගින් පවත්වන ලදී. පාඨමාලාවේ කාලසීමාව මාස තුනක් වූ අතර සිසුන් 40 කු පමණ පාඨමාලාව හදාරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ Stanford විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිධාරිනියක් සහ Veritae Research (Pvt) Ltd හි පර්යේෂකවරියක් වන Faiza Chatoor මහත්මිය මෙහි සම්පත් දායකත්වය ලබා දෙන ලදී. ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 ජූලි 7 වන දින කොළඹ මහජන පුස්තකාල සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු අතර පාඨමාලාව සාර්ථකව නිමකල 36 දෙනෙකු සහතිකපත් ලබා ගත්හ. මීළඟ බඳවා ගැනීම සැප්තැම්බර් මාසයේදී සිදු කෙරේ.




**නාගරික අස්වනු තොරතුරු මධ්‍යස්ථානය**

නාගරික අස්වැන්න යනු කොළඹ මහ නගර සභාව (CMC) විසින් Team ONE සහ තවත් බොහෝ ස්වේච්ඡා සංවිධාන සමඟ එක්ව කොළඹ නගරයේ ආහාර අනාරක්ෂිත භාවය මඟහරවා ගැනීම සඳහා CMC සමඟ සමීපව කටයුතු කරන ව්‍යාපෘතියකි. කොළඹ මහ නගර සභාව විසින් නාගරික අස්වනු තොරතුරු මධ්‍යස්ථානය කොළඹ මහජන පුස්තකාලයේ ස්ථාපිත කරන ලදී. මෙම තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන්නේ සමාජ මාධ්‍ය සමඟ එක්ව ආහාර සුරක්ෂිතතාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, පුහුණු කිරීමයි. මීට අමතරව, කොළඹ මහජන පුස්තකාල කාර්යමණ්ඩලය විසින් ඔවුන් සතුව පවතින ඉඩම් කට්ටි වගා කිරීම ආරම්භ කළේය.

## පුස්තකාලය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සඳහා අමතන්න - 2022/2023

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය 2022/2023 සඳහා පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සඳහා අයදුම්පත් කැඳවයි. වැඩි විස්තර SLLA වෙබ් අඩවියෙන් ලබා ගත හැක- www.slla.org.lk

### SRI LANKA LIBRARY ASSOCIATION


**Diploma in Library and Information Science (DLIS) – 2022/2023**

An opportunity to be a Professional Librarian

The Diploma in Library and Information Science Education course, is your entry qualification for an inspiring career in the Library and Information Sector. Applications can be sent until **15th Aug, 2022** for the 2022/2023 academic year for Library and Information Science.

**Required Qualification**

| | |
|---|---|
| 1 | I. G.C.E. (A/L) in three subjects in one sitting **AND**<br>II. G.C.E. (O/L) in six subjects in not more than two sittings, with a Credit pass in first Language **and** Ordinary Passes in Mathematics/Arithmetic and English<br>**OR** |
| 2 | Permanently employed in a recognized Library with not less than three years' service and fulfillment of 2 (II) above |




| Centre | Medium |
|---|---|
| Colombo | Sinhala, Tamil |
| Galle/Kandy/Badulla | Sinhala Only |
| Jaffna/Batticaloa | Tamil Only |
| Distance (Postal + Seminars) | Sinhala Only |
| Online Course | English Only |

**Mode of Delivery**

(i) Class room lectures, online lectures. (Course Fee: **Rs.19, 500/-**)

(ii) Distance (Postal + Seminars) Sinhala Medium. **Rs. 23,500/-** (Distance).

(iii) Applicants must select only one medium and one study center. All classes are held on Sundays.

**Application Details and how to apply**

1. Application can be obtained from the SLLA Web site (www.slla.lk)
2. Application Fees Rs. 500/-
3. Application closing date : **15 Aug 2022**

Kindly make the application fee payment in any branch of Bank of Ceylon 0002323087 on or before 15th August 2022 and send the original copy of the payment receipt (Keep a copy of same for your reference please), dully application and copies of the relevant certificates to the Sri Lanka Library Association.

Education Officer, Sri Lanka Library Association,
275/75, OPA Centre, Prof. Stanley Wijesundara Mawatha,
Colombo 07.

**Telephone - 0112589103, 0715421421**
**E- mail** - education.slla@gmail.com
**Web** - www.slla.lk

Education Officer - 0714110054

## විභාග නැවත පැවැත්වීම

පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා නැවත පෙනී සිටින පරීක්ෂණය අප්‍රේල් 09 සහ 10 යන දෙදින තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේදී අන්තර්ජාලය හරහා පැවැත්විණි. විභාගය සඳහා සිංහල මාධ්‍ය සිසුන් 30 දෙනෙකු සහ දෙමළ මාධ්‍ය සිසුන් 23 දෙනෙකු සහභාගී වී සිටියහ.




## 2021/2022 පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන

පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සිසුන් 307 දෙනෙකු සඳහා දිවයින පුරා පුස්තකාල 22 ක ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, යාපනය මහජන පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, ජාතික පුස්තකාලය, ගාල්ල මහජන පුස්තකාලය, මහනුවර මහජන පුස්තකාලය, බදුල්ල මහජන පුස්තකාලය, මහරගම මහජන පුස්තකාලය, අනුරාධපුර මහජන පුස්තකාලය, වවුනියාව මහජන පුස්තකාලය, මන්නාරම මහජන පුස්තකාලය, නුවරඑළිය මහජන පුස්තකාලය, නාවලපිටිය මහජන පුස්තකාලය, බණ්ඩාරවෙල මහජන පුස්තකාලය, ජාතික සහයෝගිතා සංවර්ධන ආයතනය, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය (SVIAS) සහ උකුවෙල මහජන පුස්තකාලය යන පුස්තකාලවල මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## RECOMMENDED CODE FOR THE DLIS/ HDPLIS TRANSCRIPTS

### DLIS - Diploma in Library and Information Science

| | |
|---|---|
| DLIS 101 | Librarianship |
| DLIS 102 | Organization of Information: Cataloguing |
| DLIS 103 | Organization of Information: Classification |
| DLIS 104 | Library Resources and Services |

### HDIPLISI Higher Diploma in Library and Information Science - level I

| | |
|---|---|
| HDIP 201 | Library and Information Services |
| HDIP 202 | Organization of Information: Cataloguing & Classification |
| HDIP 203 | Office and Library Management |
| HDIP 204 | Information & Communication Technology |
| HDIP 205 | Compilation of a Bibliography / Index - project |

### HDIPLIS - II Higher Diploma in Library and Information Science - level II

| | |
|---|---|
| HDIP 301 | Library and Information Services |
| HDIP 302 | Organization of Information: Indexing & Retrieval – Indexing & Retrieval |
| HDIP 303 | Management |
| HDIP 304 | Library Automation |
| HDIP 305 | Research methods - Project |

### ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේනවකථිකාචාර්ය පත්වීම්

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් එහි කථිකාචාර්ය මණ්ඩලය නව කථිකාචාර්යවරුන් 8 දෙනෙකු පත් කර ඇත.

පාතේකඩ රේවත හිමි
ආචාර්ය එස්.කේ. ඉලංගරත්න මයා
ඒ.පී.යූ ද සිල්වා මිය
පී. ධර්මසිරිවර්ධන මිය
ටී.එම්. චමෝදි හංසමාලී මිය
අයි.එන්. පොල්ගම්පල මිය
ආර්.ඒ.පී.එස්. සෙනෙවිරත්න මිය
එම්. ඉන්ද්‍රානි මිය (දෙමළ මාධ්‍ය)

### පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා (DLIS) සම්මාන උළෙල

පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා (DLIS) ප්‍රදානෝත්සවය සහ කථිකාචාර්ය ඇගයීම් වැඩසටහන 2022 ජුනි 24 වැනි දින කොළඹ 07, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේදී පැවැත්විණි. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂක ආචාර්ය ප්‍රදීපා විජේතුංග මහත්මිය විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු පුස්තකාලයාධිපති මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතාද ප්‍රධාන ආරාධිතයකු ලෙස සහභාගී විය. කථිකාචාර්යවරුන් 64 දෙනෙකුගෙන් 30 දෙනෙකු සම්මානයට පාත්‍ර විය. රාජ්‍ය තාන්ත්‍රිකයින් 330 දෙනෙකුට සම්මාන ප්‍රදානය කිරීමට නියමිතව තිබූ අතර උත්සවය සඳහා රාජ්‍ය තාන්ත්‍රිකයින් 142 දෙනෙකු සහභාගී විය.













# COLA යාවත්කාලීන කිරීම

## COLA සමාරම්භක උත්සවය

පුස්තකාල ස්වයංක්‍රීයකරණය (COLA) 2022 පාඨමාලාවේ සමාරම්භක උත්සවය 2022.04.31 වන දින පෙරවරු 9.30 සිට 10.30 දක්වා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවත්විණ. සම්ප්‍රදායික තෙල් පහන දැල්වීමෙන් අනතුරුව උත්සවය ආරම්භ විය. ඉන්පසු COLA හි පාඨමාලා සම්බන්ධීකාරක ආර්.එම්. නදීකා රත්නබාහු මහත්මිය සියළුම ආරාධිත අමුත්තන් සහ සිසුන් සාදරයෙන් පිළිගනු ලැබූහ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභා සාමාජිකයින් වන සභාපති ආචාර්ය ආනන්ද තිස්ස, තේරී පත් වූ සභාපති එස්.පී.කේ.කේ.ඒ. ලියනගේ, එහි ලේකම් හා කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපති වරුණි ගංගාබඩආරච්චි, භාණ්ඩාගාරික කේ.ජී.එස්. ගුණතිලක, අධ්‍යාපන නිලධාරි කේ. එන්. සමන්ති යන මහත්ම මහත්මීන් මේ සඳහා සහභාගී විය.









## තොරතුරු තාක්ෂණ කණ්ඩායම් යාවත්කාලීන කිරීම

ඩිප්ලෝමා වැඩසටහන් සඳහා Moodle Learning Management System (LMS) පවතින අන්තර්ගතයන් සමඟ යාවත්කාලීන කර ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) බලපත්‍ර 5ක් සහිත නව Zoom ගිණුමට දායක වී ඇත.
තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) සඳහා නිල LinkedIn ගිණුමක් නිර්මාණය කර ඇති අතර ඔබට එම පිටුවට පහත ලිපිනය ඔස්සේ පිවිසිය හැක. https://www.linkedin. com/in/library-association-sri-lanka-8784b639/

## SLLA පුවත් පත්‍රිකාව එළිදැක්වීම

SLLA පුවත් පත්‍රිකාවේ 38 වන වෙළුමේ 2 සහ 3 කාණ්ඩය නිකුත් කර ඇති අතර පහත ලිපිනය හරහා ප්‍රවේශ විය හැකිය. https://www.slla.lk/




## "පුද්ගල පර්යේෂණ උපදේශනය" සඳහා නව සේවාවක් ආරම්භ කිරීම

2014 දී නැගෙනහිර විශ්ව විද්‍යාල පුස්තකාලය විසින් 'පර්යේෂණ උපකාරක සේවාවක්' දියත් කර ඇති අතර සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පුස්තකාලය අඛණ්ඩව එම සේවාව සාර්ථකව සපයන ලදී. පර්යේෂණ උපකාරක සේවාවේ දිගුවක් ලෙස සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පුස්තකාලය විසින් 'තනි පුද්ගල පර්යේෂණ උපදේශනය' නමින් නව සේවාවක් ආරම්භ කරන ලදී. මෙම සේවාව ප්‍රධාන වශයෙන් පීඨයේ උපාධි අපේක්ෂක පර්යේෂකයන් ඉලක්ක කරගනිමින් ආරම්භ කර ඇත. ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිය අතරතුර, උපාධි අපේක්ෂකයින්ට පර්යේෂණ ආශ්‍රිත උපදෙස් ලබා ගැනීම සඳහා පුද්ගලයන් හෝ කණ්ඩායම් වශයෙන් පුස්තකාල වෘත්තිකයන් හමුවිය හැක. පීඨයේ කණ්ඩායම් පර්යේෂණ ව්‍යාපෘති ඇති බැවින් සිසුන් පර්යේෂණ කණ්ඩායමක් ලෙස පුස්තකාල වෘත්තිකයන් හමුවීමට කැමැත්තක් දක්වයි. විශේෂයෙන්ම සාහිත්‍ය ගවේශණය, විමර්ශන මූලාශ්‍ර සැකසීම, ප්‍රශ්නාවලිය සැලසුම් කිරීම සහ දත්ත විශ්ලේෂණය සඳහා සිසුන් පුස්තකාලයාධිපතිවරුන්ගෙන් උපදෙස් හා සහාය ලබා ගනී, සෑම උපදේශනයකින්ම පසු සිසුන්ගේ ප්‍රතිපෝෂණය වෙනම වාර්තාවක පවත්වාගෙන යනු ලැබේ. ප්‍රතිපෝෂණවලට අනුව පීඨයේ උපාධි අපේක්ෂකයින් මෙම සේවාව බෙහෙවින් අගය කර ඇති අතර මෙම සේවාව ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති එස්.ශාන්ත රූබන් මහතා විසින් ආරම්භ කර ඇත.




## මාර්ගගත සම්මන්ත්‍රණ මාලාව

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තොරතුරු හා මහජන සම්බන්ධතා කමිටුව විසින් සංවිධානය කරන ලද මාර්ගගත සම්මන්ත්‍රණ මාලාව 2022 අප්‍රේල් සිට 2022 මැයි දක්වා සති අන්තවල පැවැත්විණි. 2022 දී රජයේ පුස්තකාලයාධිපතිවරුන් බඳවා ගැනීමේ විවෘත / සීමිත තරඟ විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් 200 දෙනෙකුට ප්‍රතිලාභ සැලසෙන පරිදි මෙම සම්මන්ත්‍රණ මාලාව සංවිධානය කරන ලදී.

ආචාර්ය ආර්.ඩී.ආනන්ද තිස්ස, ආචාර්ය එස්.කේ.ඉලංගරත්න, ආචාර්ය රුවන් ගමගේ, ආචාර්ය ජී.ආර්.පද්මසිරි, දිල්හානි මුණසිංහ, ප්‍රීති ලියනගේ, සුගත් ගුණතිලක, හංසමාලි තෙන්නකෝන් සහ කේ.එන්.සමන්ති යන මහත්ම මහත්මීහු මෙම සම්මන්ත්‍රණ මාලාව මෙහෙයවූහ.


මෙම සම්මන්ත්‍රණ මාලාවට සහභාගී වන අපේක්ෂකයින් සඳහා "Librarian Exam" නමින් WhatsApp කණ්ඩායමක් පිහිටුවා ඇති අතර, ඒ හරහා දේශන පටිගත කිරීම් බෙදා හරිනු ඇත. තවද, තොරතුරු හා මහජන සම්බන්ධතා නිලධාරිනී එම්.කේ.ජී. යානිකා නන්දසේන මහත්මිය විසින් "ශ්‍රී ලංකාවේ රජයේ පුස්තකාල" නමින් බ්ලොග් අඩවියක් එළිදැක්වීය. මෙම සම්මන්ත්‍රණ මාලාවට සමගාමීව අයදුම්කරුවන්ට කාලීන තොරතුරු ලබා ගැනීමේ පහසුකම ඇත.

https://governmentlibraysrilanka.blogspot.com/

## HARTI ප්‍රකාශන ග්‍රන්ථ නාමාවලිය එළිදැක්වීම

HARTI ආයතනය විසින් 1972 - 2022 දක්වා ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශන ඇතුලත් HARTI ග්‍රන්ථ නාමාවලිය එළිදැක්වීම 2022.02.21 දින HARTI අනුස්මරණ උත්සවයේදී සිදුවිය. සහකාර පුස්තකාලයාධිපති යමුනා වීරරත්න මෙනවිය විසින් සම්පාදනය කරන ලද අතර මෙම ග්‍රන්ථ නාමාවලියේ පළමු පිටපත පුස්තකාලයේ දියුණුවට විශාල දායකත්වයක් ලබාදුන් ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ගාමිණී සෙනෙවිරත්න මහතා වෙත පිළිගැන්විණි. 1972 සිට 2022 දක්වා HARTI ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද සිංහල සහ ඉංග්‍රීසි පොත් හා පර්යේෂණ වාර්තා 590 ක තොරතුරු මෙම ග්‍රන්ථ නාමාවලියෙහි අඩංගු වේ.මෙම ග්‍රන්ථ නාමාවලියට පහත වෙබ් ලිපිනය ඔස්සේ ප්‍රවේශ විය හැක.http://www.harti.gov.lk






## 7th SANKATHANA PUBLIC LECTURER SERIES HELD



# Sri Lanka Library Association

**Organization of Professional Associations**
**Sri Lanka Professional Centre**
**275/75, Stanley WijesundaraMawatha, Colombo 07.**
**Sri Lanka**
Tel/Fax: +94-11-2589103
Email: info@slla.lk


- SLLA Newsletter –

https://www.slla.lk